# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2022

2025 ජූලි

**මානවශාස්ත්‍ර පීඨය**

## සාහිත්‍ය විචාරය

(නව නිර්දේශය)

**දහනව වන සියවසෙහි අපරදිග සාහිත්‍ය නිර්මාණ සහ විචාර අධ්‍යයනය**

**LTCR 38214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.** **කාලය : පැය 03 යි.**

---

01. සොබා දහම හා මනුෂ්‍යත්වය පිළිබඳ අපරදිග රොමැන්ටික් කවීන්ගේ ප්‍රවේශය නිදර්ශනාශ්‍රයෙන් විභාග කරන්න.

02. චාල්ස් ඩිකන්ස් විසින් රචිත ඔලිවර් ට්විස්ට් **(Oliver Twist)** නවකතාවෙහි නිරූපිත කාලීන සමාජ යථාර්ථය සනිදර්ශනව විභාග කරන්න.

03. ඔනේරේඩ් බල්සාක්ගේ **Engenie Grandet** (සිත පිවිතුරු ළඳ) කෘතියෙහි චිත්‍රිත ප්‍රංශ සමාජයෙහි ස්වභාවය හා මානව සබඳතා පිළිබඳ විග්‍රහයක් කරන්න.

04. රොමැන්ටික්වාදය හඳුන්වා එහි ආභාසය වික්ටර් හියුගෝ විසින් රචිත **Les Miserables** (මනුතාපය) නවකතාව මත පතිතව ඇති ආකාරය විමර්ශනය කරන්න.

05. "ඇන්ටන් චෙකොෆ් විසින් නිර්මාණකරණය හා විචාරය අරභයා පළකරන ලද අදහස් ලේඛකයාගේ ස්වාධීනතාව තහවුරු කරයි." මෙහි සත්‍යාසත්‍යතාව විමර්ශනය කරන්න.

06. "තුන් අවුරුද්ද පරිවර්තන කෙටිනවකතාවෙහි සමකාලීන රුසියානු මධ්‍යම පාන්තික සමාජ ජීවිතයෙහි හරසුන් නිස්සාර පැවැත්ම යථාර්ථවාදී ප්‍රවේශයකින් නිරූපිතය." මෙහි සත්‍යාසත්‍යතාව පහදන්න.

07. "බලාධිකාරිය විසින් නිර්ප්‍රභූ ජනප්‍රජා මර්දනයට හා අපහරණයට පත් කෙරෙන ආකාරය ස්ත්‍රී-කර්තෘක ඉතිහාසය විෂයයක සිංහල නවකතාවන්හි යථානුරූපීව නිරූපිතය." මෙහි යුක්තියායුක්තතාව පරිපීඩිතයන් පිළිබඳ සාහිත්‍ය විචාර න්‍යාය ආශ්‍රයෙන් විභාග කරන්න.

08. මානවවාදය බිහිවීම සඳහා ප්‍රංශ විප්ලවය බලපෑ ආකාරය සනිදර්ශනව විභාග කරන්න.

09. මාක්ස්වාදය පිළිබඳ මූලික හැඳින්වීමක් සිදුකර සාහිත්‍ය විචාරය සඳහා එය භාවිත කළ හැකි ආකාරය නිදසුන් ඇසුරෙන් පහදන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගිනි.)

***********************